අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# ජීව විද්‍යාව

## විෂය නිර්දේශය

### 12 වන සහ 13 වන ශ්‍රේණි

### (2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

විද්‍යා, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## 1.0 හැඳින්වීම

ජීව විද්‍යාව, සියලු ම ජීවීන්ට ජෛව හා අජෛව පරිසර සමග සහජීවනයෙන් වෙසෙන්නට අත්‍යවශ්‍ය වන, ජීවීන් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයකි. ජීව විද්‍යාව ඉගෙනීම අංශ ගණනාවකින් වැදගත් වේ.

1) ජීවීන් හා සම්බන්ධ සංකල්ප, මූලධර්ම හා වාද පිළිබඳ පුළුල් දැක්මක් ඇති කර ගැනීම.
2) පරිසර හායනය, කෘෂිකාර්මික නිෂ්පාදන අඩු වීම , පිළිකා, HIV ආදී පුළුල් ලෙස පැතිරී යන රෝග වැනි වත්මනෙහි මිනිසා මුහුණ පාන ගැටලුවලට විසැඳුම් සහ විකල්ප සොයා ගැනීම.
3) සොබා දහම සහ පරිසරය සංරක්ෂණය හා සබැඳි හර පද්ධති පෝෂණය කෙරෙන ආකල්පත්, සතිමත් බවත්, සංවර්ධනය කිරීම.

අ.පො.ස. (උ.පෙළ) ජීව විද්‍යා විෂය නිර්දේශය ගොඩ නගා ඇත්තේ නිපුණතා පාදක, ශිෂ්‍ය කේන්ද්‍රීය සහ ක්‍රියාකාරකම් දිශාභිමුඛ ප්‍රවේශයක් සහිත ව ය. එ මගින් ඉලක්ක සිසු කණ්ඩායම් තුළ පුද්ගල හැකියා, අන්තර් පුද්ගල සබඳතා සහ චින්තන කුසලතා සංවර්ධනය කෙරෙතැ යි අපේක්ෂා කෙරේ. එ සේ ම මෙම විෂය නිර්දේශය ජාත්‍යන්තර විෂය නිර්දේශ සමග ද සමගාමී වේ.

මෙම ජීව විද්‍යාව විෂය නිර්දේශය සංස්කරණයේ දී තෘතියික මට්ටමේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරන අතර ම වෙනත් විෂය පථ ඔස්සේ ඉදිරියට යන බහුතරයක් වූ සිසුන්ගේ අවශ්‍යතා ද සැලැකිල්ලට ගන්නා ලදී. ඒ හැරුණු විට ජීව විද්‍යාත්මක මූලධර්ම හා ඒවායේ භාවිත පිළිබඳ ලබා ගන්නා පුළුල් දැනුම එදිනෙදා ජීවිත කටයුතුවල දී මෙන් ම සමාජ අවශ්‍යතා සඳහා ද වාසි දායක වෙයි.

මෙම විෂය නිර්දේශය සංස්කරණයේ දී පහත දැක්වෙන ප්‍රධාන වෙනස් කම් සිදු කර ඇත.

- සදාචාරාත්මක අවශ්‍යතාවක් ලෙස සලකා නව ජීව විද්‍යා විෂයමාලාවෙන් සත්ත්ව විච්ඡේදන සම්පූර්ණයෙන් ම ඉවත් කර ඇත. එ වැනි විෂය ක්ෂේත්‍ර ඉගැන්වීමේ දී ආකෘති, රූප සටහන් සහ පරිගණක ආශ්‍රිත ආදර්ශන යොදා ගැනීමට යෝජනා කෙරේ.
- පැවැති ජීව විද්‍යා විෂය නිර්දේශයේ තිබුණු ඒකක නවය (09) දැන් ඒකක 14 කට බෙදා වෙන් කර ඇත. ක්‍රියාකාරී ශාකය හා ක්‍රියාකාරී සත්ත්වයා ලෙස පැවති ඒකක නව විෂය නිර්දේශයේ, ශාක සහ සතුන්ගේ කායික විද්‍යාත්මක කෘත්‍ය පදනම් කර ගෙන ඒකකවලට බෙදා තිබීම කැපී පෙනෙන වෙනසකි. මෙ මගින් සිසුනට ශාක සහ සත්ත්ව කායික කෘත්‍ය පිළිබඳ සමෝධානික ප්‍රවේශයක් ලබා ගත හැකි වේ.

- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සෛද්ධාන්තික සංරචක සමග ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද, සමගාමී ව සිදු කිරීමට අපේක්ෂා කෙරේ. අවශ්‍යතාවලට අනුව අතිරේක ව ද ප්‍රායෝගික සැසි සහ ක්‍රියාකාරකම් සිදු කළ හැකි ය.
- විෂය සන්ධාරය අඩු කිරීමේ අරමුණින් පැවැති විෂය නිර්දේශයේ තිබුණු 'මූලික සංඛ්‍යානය' නම් වූ ඒකකය ඉවත් කර ඇත.
- වර්ගීකරණය හා නාමකරණය ඇතුළත් වන්නේ 'ජීවීන්ගේ විවිධත්වය' යන ඒකකය යටතේ ය.
- නූතන ජීවී වර්ගීකරණ පද්ධතියට අදාළ ව අනුක්‍රමාධිපත්‍ය මට්ටමක් වශයෙන් 'අධිරාජධානි' (Domain) හඳුන්වා දී තිබේ.
- පැවැති විෂය නිර්දේශයේ අඩංගු වූ දිලීරවල ජීවන චක්‍ර සම්පූර්ණයෙන්මත්, ශාකවල ජීවන චක්‍රවල ප්‍රජනක ව්‍යුහ පිළිබඳ විස්තරත් , ඉවත්කර ඇත.
- සත්ත්ව රාජධානියේ වර්ගීකරණය පැහැදිලි ලෙස වෙන් කර දක්වා ඇති අතර, ප්‍රොටොසෝවා රාජධානියේ වර්ග සංස්කරණය කර ඇත.
- නව විෂය නිර්දේශයේ ජාන පිළිසකර කළ ජීවීන් භාවිත කිරීම පිළිබඳ සමාජමය ගැටලුව සහ ශ්‍රී ලංකාවට අදාළ ව 'අපජලය' නිදහස් කිරීමට පදනම් වූ නෛතික සීමා හඳුන්වා දී ඇත. එයින් අපේක්ෂා කරන්නේ සංවර්ධන ක්‍රියාවලිය නිසා මිනිසා විසින් ම උත්පාදනය කර ඇති ගැටලු කෙරෙහි අවධානය යොමු කරවීම යි.
- රෝග සෑදීමේ වැදගත් කාරකයක් ලෙස ප්‍රියෝන (Prions) හඳුන්වා දී ඇත.
- ශ්‍රී ලාංකේය පරිසර පද්ධතිවල අති මහත් විවිධත්වයට හුරුපුරුදු කරනු වස් එම පරිසර පද්ධති පිළිබඳ අධ්‍යයනය පුළුල් කෙරිණි.
- ව්‍යවහාරික ජීව විද්‍යා ඒකකය තුළට ජලජ ශාක රෝපණය කිරීම අඩංගු කර ඇත. කාලීන ව්‍යාප්තිය සලකමින් සමහර පලිබෝධකයින් ඉවත් කිරීමත් තවත් සමහරක් ඇතුළත් කිරීමත් සිදු කර ඇත.
- පැවැති විෂය නිර්දේශයේ 'වී වගාව' ආශ්‍රිත වැදගත් රෝග ගැන පමණක් අවධාරණය කර ඇති නමුත්, නව විෂය නිර්දේශයේ ක්ෂුද්‍ර ජීවීන් හේතුවෙන් ඇති වන ශාක රෝග පිළිබඳ සාමාන්‍ය අධ්‍යයනයක් ඇතුළත් කෙරේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයා :

- ජීව විද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධ ව පෘථුල ලෙසත්, ගැඹුරිනුත් දැනුම ලබා ගැනීමට උනන්දුවක් සහ ඇල්මක් ගොඩ නඟා ගනියි.
- සහයෝගී ඉගෙනුමෙහි නිරත වෙමින් ජීව විද්‍යාවේ සංකල්ප, සංසිද්ධි, මූලධර්ම හා ක්‍රියාවලි අවබෝධ කර ගනියි.
- ස්වාභාවික හා සාමාජීය පරිසරයට ඇති වන බලපෑම හා අන්තර් ක්‍රියා අවබෝධ කර ගනිමින් ස්වභාවයේ අපට හිමි ස්ථානය නිශ්චය කර ගනියි.
- ජීව විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ගැටලු විසැඳීම සඳහා ගවේෂණාත්මක ක්‍රියාවලි සැලැසුම් කිරීමේ හැකියාව ගොඩ නඟා ගනියි.
- දේශයේ ස්වාභාවික වාසස්ථාන හඳුනා ගනිමින්, වෘක්ෂලතා සහ සත්ත්ව වර්ගයා කෙරෙහි ඇති කර ගනු ලබන ධනාත්මක ආකල්ප සහිත ව, පරිසර සංරක්ෂණ සහ පරිසරයේ ගුණාත්මය රැකීමේ වගකීම සහ දායකත්වය උදෙසා, තමාත් පරිසරයේ ම කොටසක් යැ යන හැඟීම ගොඩ නඟා ගනියි.
- එදිනෙදා ජීවිතයේ දී හමු වන ප්‍රායෝගික ගැටලු පිළිබඳ සංවේදී බව ඇති කර ගනියි.
- ස්වස්ථතාව, සෞඛ්‍යය හා ජීවිතයේ ගුණාත්මය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන සහ පුරුදු පිළිබඳ සතිමත් වෙයි.

## විෂය නිර්දේශය වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් |
|---|---|---|
| 12 | 1 | 1.1.1 - 3.1.5 (නිපුණතා මට්ටම් 20) |
| | 2 | 3.1.6 - 7.1.3 (නිපුණතා මට්ටම් 18) |
| | 3 | 7.1.4 - 9.1.6 (නිපුණතා මට්ටම් 16) |
| 13 | 1 | 10.1.1 - 11.1.4 (නිපුණතා මට්ටම් 16) |
| | 2 | 11.1.5 - 13.1.2 (නිපුණතා මට්ටම් 17) |
| | 3 | 13.1.3 - 14.1.6 (නිපුණතා මට්ටම් 14) |

## 3.0 විෂය නිර්දේශය

## 3.1 - 12 වන ශ්‍රේණිය

1 ඒකකය - ජීව විද්‍යාව හැඳින්වීම

කාලච්ඡේද 9

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1.1.0 ජීව විද්‍යාත්මක පදනමකින් ගවේෂණ මෙහෙයවයි. | 1.1.1 මානව අභියෝගවලට විශේෂ අවධානයක් සහිත ව ජීව විද්‍යාවේ ස්වභාවය, විෂය පථය හා වැදගත් කම විස්තාරණය කරයි. | ● ජීව විද්‍යාව හා බැඳුණු ගැටලු<br>● ජීවීන්ගේ විවිධත්වය පිළිබඳ අවබෝධය<br>● මිනිස් සිරුර හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය<br>● ස්වාභාවික සම්පත් හා පරිසරය කළමනාකරණය<br>● තිරසාර ආහාර නිෂ්පාදනය<br>● රෝග පිළිබඳ අවබෝධය | 1 |
| | 1.1.2 ජීවී ලෝකයේ ස්වභාවය සහ සංවිධාන රටා පිළිබඳ සමාලෝචනයෙහි යෙදෙයි. | ● ජීවීන්ගේ ස්වභාවය - තරම, හැඩය, ආකාරය, ව්‍යාප්තිය<br>● ජීවීන්ගේ අනන්‍ය ලක්ෂණ<br>● ක්‍රමවත් බව හා සංවිධානය<br>● පරිවෘත්තිය<br>● වර්ධනය සහ විකසනය<br>● උද්දීප්‍යතාව සහ සමායෝජනය<br>● අනුවර්තනය<br>● ප්‍රජනනය<br>● ප්‍රවේණිය සහ පරිණාමය<br>● ජීව සංවිධානයේ ධූරාවලි මට්ටම්<br>● අණු<br>● ඉන්ද්‍රියිකා හා සෛල<br>● පටක<br>● අවයව<br>● අවයව පද්ධති<br>● ජීවියා | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ගහනය<br>• ප්‍රජාව<br>• පරිසර පද්ධති<br>• ජෛව ගෝලය<br>● ජීවයේ මූලික ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය ලෙස සෛලය | |
| | 1.1.3 ජීව විද්‍යාත්මක ගැටලු විසැඳීමට විද්‍යාත්මක ක්‍රමය භාවිත කරයි. | ● ජීව විද්‍යාත්මක ගැටලු විසඳා ගැනීමට විද්‍යාත්මක ක්‍රමය යොදා ගැනීමේ වැදගත් කම<br>● විද්‍යාත්මක ක්‍රමයේ පියවර<br>• නිරීක්ෂණ තුළින් ගැටලුව හඳුනා ගැනීම<br>• කල්පිත ගොඩ නැඟීම<br>• කල්පිත පරීක්ෂා කිරීම සඳහා පාලක පරීක්ෂණ සහිත පරීක්ෂණ භාවිතය<br>• වඩාත් උචිත කල්පිතය තෝරා ගැනීම<br>• න්‍යාය ගොඩ නැඟීම | 4 |

# 2 ඒකකය - ජීවයේ රසායනික හා සෛලීය පදනම

කාලච්ඡේද 67

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2.1.0 ජීවයේ රසායනික පදනම පිළිබඳ විස්තාරණය කරයි. | 2.1.1 ජීවී දේහයේ මූලද්‍රව්‍යමය සංයුතිය පිළිබඳ විමසා බලයි. | ● සජීව පදාර්ථයේ මූලද්‍රව්‍ය සංයුතිය<br>● අධි මාත්‍ර මූලද්‍රව්‍ය<br>● අංශු මාත්‍ර මූලද්‍රව්‍ය<br>● අධි මාත්‍ර හා අංශු මාත්‍ර මූලද්‍රව්‍යවල කෘත්‍ය | 2 |
| | 2.1.2 ජීවය සඳහා වැදගත් වන ජලයේ භෞතික හා රසායනික ගුණ පිළිබඳ විමර්ශනය කරයි. | ● ජීවය සඳහා ජලයේ ඇති වැදගත් කම<br>● ජලයේ භෞතික හා රසායනික ගුණ ජීවය සඳහා වැදගත් වන ආකාරය | 3 |
| | 2.1.3 ජීවීන්ගේ ප්‍රධාන කාබනික සංයෝගවල රසායනික ස්වභාවය සහ කෘත්‍ය විමර්ශනය කරයි. | ● ජීවීන් තුළ ඇති ප්‍රධාන කාබනික සංයෝග කාණ්ඩ හතරෙහි ව්‍යුහ හා කෘත්‍ය<br>● කාබෝහයිඩ්‍රේට, ප්‍රෝටීන, ලිපිඩ සහ නියුක්ලෙයික් අම්ල<br>● කාබෝහයිඩ්‍රේට<br>● මොනොසැකරයිඩ, ඩයිසැකරයිඩ හා පොලිසැකරයිඩ<br>● කාබෝහයිඩ්‍රේටවල කෘත්‍ය<br>● ලිපිඩ<br>● මේද සහ තෙල්, පොස්පොලිපිඩ, ස්ටෙරොයිඩ<br>● ලිපිඩවල කෘත්‍ය<br>● ප්‍රෝටීන<br>● ඇමයිනෝ අම්ල සහ පෙප්ටයිඩ බන්ධන<br>● ප්‍රෝටීනවල ප්‍රාථමික, ද්විතියික, තෘතියික හා චාතුර්ථ ව්‍යුහ<br>● ප්‍රෝටීනවල කෘත්‍ය | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | ● නියුක්ලෙයික් අම්ල<br>● නියුක්ලියොටයිඩ සහ පොලිනියුක්ලියොටයිඩ<br>● DNA හා RNAවල ව්‍යුහ<br>● DNA ද්විත්ව හෙලික්සීය ව්‍යුහය<br>● DNA ප්‍රතිවලිත වීම<br>● DNA හා RNAවල කෘත්‍ය<br>● ඔක්සිහාරක හා නිර්ඔක්සිහාරක සීනි, පිෂ්ටය, ප්‍රෝටීන සහ ලිපිඩ හඳුනා ගැනීම සඳහා සරල විද්‍යාගාර පරීක්‍ෂා | |
| 2.2.0 ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය සඳහා සෛල හා පටකවල දායකත්වය විමසා බලයි. | 2.2.1 සෛල හා සෛලීය සංවිධාන පිළිබඳ දැනුම පුළුල් කර ගැනීම සඳහා අණ්වීක්‍ෂවල දායකත්වය විස්තාරණය කරයි. | ● ජීව විද්‍යාවේ භාවිත වන මෙවලමක් වශයෙන් අණ්වීක්‍ෂ<br>● ආලෝක අණ්වීක්ෂය<br>● ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂය<br>● සෛල වාදය<br>● සෛලීය සංවිධාන<br>● ප්‍රාග් න්‍යෂ්ටික<br>● සුන්‍යෂ්ටික<br>● නිදර්ශක නිරීක්‍ෂණය සඳහා අණ්වීක්‍ෂ භාවිතය<br>● සෛලීය සංඝටකවල ව්‍යුහය අවබෝධ කර ගැනීම සඳහා ඉලෙක්ට්‍රෝන අණ්වීක්‍ෂීය ඡායාරූප භාවිතය | 5 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.2.2 උපසෛලීය ඒකකවල ව්‍යුහය සහ කෘත්‍ය විග්‍රහ කරයි. | ● ඉලෙක්ට්‍රෝන අණ්වීක්ෂීය ඡායාරූප මඟින් දැක්වෙන පරිදි දර්ශීය ශාක හා සත්ත්ව සෛලවල ව්‍යුහ<br>● ඉන්ද්‍රියිකා සහ උපසෛලීය සංඝටකවල ව්‍යුහ සහ කෘත්‍ය<br>● සෛල බිත්තිය<br>● ප්ලාස්ම පටලය<br>● න්‍යෂ්ටිය<br>● රයිබොසෝම<br>● රළු හා සිනිඳු අන්තඃ ප්ලාස්මීය ජාලිකා<br>● ගොල්ජි දේහ<br>● ලයිසොසෝම<br>● මයිටොකොන්ඩ්‍රියා<br>● හරිතලව<br>● ක්ෂුද්‍ර නාලිකා<br>● ක්ෂුද්‍ර දේහ (පෙරොක්සිසෝම, ග්ලයොක්සිසෝම)<br>● රික්තක<br>● සෛල සන්ධි<br>● සෛල සැකිල්ල<br>● කෂිකා සහ පක්ෂ්ම<br>● කේන්ද්‍රිකාව | 7 |
| | 2.2.3 ශාක පටකවල ව්‍යුහය, ඒවායේ කෘත්‍ය සමග දක්වන සම්බන්ධතා ගොඩ නගයි. | ● බහු සෛලික ජීවීන්ගේ පටක<br>● ශාක පටක වර්ග, ඒවායේ ව්‍යුහ හා කෘත්‍ය<br>● මෘදුස්තර<br>● ස්ථූලකෝණාස්තර<br>● දෘඪස්තර<br>● ශෛලම | 5 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ෆ්ලෝයම<br>• විවිධ ශාක පටක අණ්වීක්ෂයෙන් නිරීක්ෂණය කිරීම සහ හඳුනා ගැනීම | |
| | 2.2.4 සත්ත්ව පටකවල ව්‍යුහය, ඒවායේ කෘත්‍ය සමග දක්වන සම්බන්ධතා ගොඩ නගයි. | • සත්ත්ව පටක වර්ග, ව්‍යුහ හා කෘත්‍ය<br>• අපිච්ඡද<br>• සම්බන්ධක<br>• පේශි<br>• ස්නායු<br>• විවිධ සත්ත්ව පටක අණ්වීක්ෂයෙන් නිරීක්ෂණය කිරීම සහ හඳුනා ගැනීම | 5 |
| 2.3.0 සෛල විභාජනයේ වැදගත් කම විමසා බලයි. | 2.3.1 සෛල විභාජන ක්‍රියාවලිය විශ්ලේෂණය කරයි. | • සෛල චක්‍රය<br>• අනුනනය<br>• අනුනන විභාජනයේ දී වර්ණදේහවල හා සෛලයේ අනෙකුත් කොටස්වල හැසිරීම<br>• අනුනන විභාජනයේ වැදගත් කම<br>• ඌනන විභාජනය<br>• ඌනන විභාජනයේ දී වර්ණදේහවල හා සෛලයේ අනිකුත් කොටස්වල හැසිරීම<br>• ඌනන විභාජනයේ වැදගත් කම<br>• අණ්වීක්ෂීය කදා මඟින් අනුනනයේ සහ ඌනනයේ විවිධ අවස්ථා හඳුනා ගැනීම | 6 |
| 2.4.0 පරිවෘත්තීය ක්‍රියාවල ශක්ති සම්බන්ධතා විමර්ශනය කරයි. | 2.4.1 පරිවෘත්තීය ක්‍රියාවලිවල ශක්ති සම්බන්ධතා විශ්ලේෂණය කරයි. | • ජීවී පද්ධති සඳහා ශක්ති අවශ්‍යතාව<br>• සංවෘත්තීය හා අපවෘත්තීය ප්‍රතික්‍රියා<br>• ශක්ති පරිවාහකයක් ලෙස ATP වල වැදගත් කම<br>• ශක්තිය සම්බන්ධ සෛලීය ක්‍රියා | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.4.2 ජෛව ක්‍රියාවලි යාමනය සඳහා එන්සයිමවල කාර්යභාරය විමර්ශනය කරයි. | ● එන්සයිම<br>● එන්සයිමවල පොදු ලාක්ෂණික<br>● සහ-සාධක<br>● සහ-එන්සයිම<br>● සංලග්න කාණ්ඩ<br>● අකාබනික අයන<br>● ප්‍රතික්‍රියා යන්ත්‍රණය<br>● සක්‍රියන ශක්තිය අඩු කිරීම<br>● අගුලු - යතුරු යන්ත්‍රණය<br>● ප්‍රේරිත - සිහුම් යන්ත්‍රණය<br>● එන්සයිමීය ප්‍රතික්‍රියා සඳහා බලපාන සාධක<br>● pH අගය<br>● උෂ්ණත්වය<br>● උපස්තර සාන්ද්‍රණය<br>● එන්සයිම සාන්ද්‍රණය<br>● නිෂේධක<br>● එන්සයිම ක්‍රියාකාරීත්වය ආදර්ශනය කිරීම සහ එන්සයිමීය ප්‍රතික්‍රියාවල ශීඝ්‍රතාව නිර්ණය කිරීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ (පිෂ්ටය - ඇමයිලේස්) | 8 |
| | 2.4.3 ශක්තිය තිර කිරීමේ ක්‍රියාවලියක් වශයෙන් ප්‍රභාසංශ්ලේෂණය විමසා බලයි. | ● ප්‍රභාසංශ්ලේෂණයේ වැදගත් කම<br>● ප්‍රභාසංශ්ලේෂණයේ ආලෝක ප්‍රතික්‍රියාව<br>● ප්‍රභා පද්ධති I - PS I<br>● ප්‍රභා පද්ධති II - PS II<br>● ජලයේ ප්‍රභාවිච්ඡේදනය<br>● NADPH හා ATP සංශ්ලේෂණය | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | ● ප්‍රභාසංශ්ලේෂණයේ අඳුරු ප්‍රතික්‍රියාව<br>● කාබොක්සිල්කරණය - RuBP කාබොක්සිලේස්වල ක්‍රියාව<br>● ඔක්සිහරණය - PGA ඔක්සිහරණය හා කාබොහයිඩ්‍රේට් සංශ්ලේෂණය<br>● RuBP ප්‍රතිජනනය<br>● ප්‍රභාසංශ්ලේෂණයේ C4 පථය<br>● ප්‍රභාසංශ්ලේෂණය කෙරෙහි බලපාන සාධක<br>● කාබන්ඩයොක්සයිඩ්<br>● ජලය<br>● ආලෝකය<br>● උෂ්ණත්වය<br>● සීමාකාරී සාධක පිළිබඳ මූලධර්මය<br>● නිදහස් කෙරෙන ඔක්සිජන් ප්‍රමාණය අනුව ප්‍රභාසංශ්ලේෂණ ශීඝ්‍රතාව නිර්ණය කිරීම | |
| | 2.4.4 ශක්තිය ලබා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් ශ්වසනය පිළිබඳ විමර්ශනය කරයි. | ● සෛලීය ශ්වසනය<br>● සෛලීය ශ්වසනයේ වැදගත් කම<br>● සවායු සහ නිර්වායු ක්‍රියාවලි<br>● සවායු ශ්වසනය-ග්ලූකෝස් ඔක්සිකරණ ක්‍රියාවලිය<br>● ග්ලයිකොලිසිය<br>● ග්ලයිකොලිසිය සිදු වන ස්ථානය<br>● උපස්තර පොස්පොරයිලීකරණය<br>● පයිරුවේට් සෑදීම<br>● ATP හා NADH සංශ්ලේෂණය | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | ● පයිරුවේට් ඇසිටයිල් සහ එන්සයිම-A (2C) බවට පත් වීම<br>● ක්රෙබ්ස් චක්‍රය<br>● ක්රෙබ්ස් චක්‍රය සිදු වන ස්ථානය<br>● සිට්රේට් සෑදීම<br>● සිට්රේට් ප්‍රතික්‍රියා චක්‍රයකින් නැවත ඔක්සැලෝ ඇසිටේට් බවට පුනර්ජනනය වීම<br>● කාබොක්සිල්හරණය සහ හයිඩ්‍රජනීහරණය සමග ATP හා ඔක්සිහරණය වූ සහ-එන්සයිම සංශ්ලේෂණය<br>● ක්‍රෙබ්ස් චක්‍රයේ පරිවෘත්තීය වැදගත් කම<br>● ලිපිඩ සහ ප්‍රෝටීන ශ්වසනයේ දී භාවිත වීම<br>● ශ්වසනයේ අතරමැදි සංයෝග ඇමයිනෝ අම්ල සංශ්ලේෂණය සඳහා භාවිත වීම<br>● ඉලෙක්ට්‍රෝන පරිවහන දාමය<br>● සිදු වන ස්ථානය<br>● ඔක්සිකාරක පොස්පොරයිලීකරණය<br>● සවායු ශ්වසනයේ දී ATP  අණු 38ක් සෑදීම<br>● නිර්වායු ශ්වසනය<br>● එතිල් ඇල්කොහොල් නිපදවීම/ශාක සෛලවල එතනෝල් පැසීම<br>● සත්ත්ව සෛලවල ලැක්ටික් අම්ලය නිපදවීම/ බැක්ටීරියාවල ලැක්ටික් අම්ල පැසීම<br>● ශ්වසන ලබ්ධිය<br>● ප්‍රරෝහණය වන බීජ භාවිතයෙන් ශ්වසන වේගය නිර්ණය කිරීම | |

## 3 ඒකකය - ජීවීන් ගේ විවිධත්වය

කාලච්ඡේද 42

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3.1.0. ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | 3.1.1 විද්‍යාත්මක පදනමක් මත තක්සෝන ධූරාවලිය ගොඩ නගයි. | ● ජීවීන් හඳුනා ගැනීම, වර්ගීකරණය හා නාමකරණය<br>● ද්විපද නාමකරණය<br>● ස්වාභාවික හා කෘත්‍රිම වර්ගීකරණ ක්‍රම<br>● සුචි භාවිතය<br>● වර්ගීකරණ පද්ධති<br>● තක්සෝන ධූරාවලිය, අධිරාජධානි (domains) සිට විශේෂය දක්වා<br>● වර්තමාන වර්ගීකරණ පද්ධතිය හා එහි පදනම<br>● අධිරාජධානි<br>● බැක්ටීරියා<br>● ආකියා<br>● යුකැරියා<br>● වයිරස<br>● යුකැරියාවල රාජධානි<br>● ප්‍රොටිස්ටා<br>● දිලීර<br>● ප්ලාන්ටේ<br>● ඇනිමාලියා | 8 |
| | 3.1.2 බැක්ටීරියා අධිරාජධානියේ ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | ● අධිරාජධානිය - යුබැක්ටීරියා<br>● බැක්ටීරියා සහ සයනොබැක්ටීරියාවල ආවේණික ලක්ෂණ<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 3.1.3 ප්‍රොටිස්ටා රාජධානියේ වංශවලට අයත් ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | ● පහත දැක්වෙන වංශවල ආවේණික ලක්ෂණ<br>● වංශය - සීලියොපෝරා<br>● වංශය - රයිසොපෝඩා<br>● වංශය - ක්‍රිසොපීටා<br>● වංශය - ෆියොපීටා<br>● වංශය - රොඩොපීටා<br>● වංශය - ක්ලෝරොපීටා<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 4 |
| | 3.1.4 දිලීර රාජධානියේ වංශවලට අයත් ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | ● රාජධානිය - දිලීර<br>● පහත දැක්වෙන වංශවල ආවේණික ලක්ෂණ<br>● වංශය - කිට්‍රිඩියොමයිකෝටා<br>● වංශය - සයිගොමයිකෝටා<br>● වංශය - අස්කොමයිකෝටා<br>● වංශය - බැසිඩියොමයිකෝටා<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 4 |
| | 3.1.5 ශාක රාජධානියේ ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | ● රාජධානිය - ශාක ( Plantae )<br>● පහත දැක්වෙන වංශවල ආවේණික ලක්ෂණ<br>● වංශය - බ්‍රයොපීටා<br>● වංශය - ලයිකොපීටා<br>● වංශය - ටෙරෝපීටා<br>● වංශය - සීකඩොපීටා<br>● වංශය - කොනිෆෙරොපීටා<br>● වංශය - ඇන්තොපීටා<br>● වර්ගය - මොනොකොටිලිඩොනේ<br>● වර්ගය - ඩයිකොටිලිඩොනේ<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | 3.1.6 සත්ත්ව රාජධානියේ ජීවීන්ගේ විවිධත්වය ගවේෂණය කරයි. | ● රාජධානිය - ඇනිමාලියා<br>● පහත දැක්වෙන වංශවල ආවේණික ලක්ෂණ (හෝජනය, ආසුැති විධානය, බහිස්ස්‍රාවය, ස්නායුක හා අන්තරාසර්ග පාලනය, ශ්වසනය, ප්‍රජනනය හා ජීවන චක්‍ර සවිස්තරාත්මක ව දැක්වීම අවශ්‍ය නැත.)<br>● සිලන්ටරේටා (නිඩාරියා)<br>● ප්ලටිහෙල්මින්තේස්<br>● නෙමටෝඩා<br>● අනෙලිඩා<br>● මොලුස්කා<br>● ආත්‍රොපොඩා<br>● එකිනොඩෙර්මටා<br>● කෝඩාටා<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 5 |
| | 3.1.7 ජීවීන් අයත් වර්ග හඳුනා ගැනීමට බාහිර ලක්ෂණ භාවිත කරයි. | ● බාහිර ලක්‍ෂණ භාවිතයෙන් පහත ප්‍රධාන වර්ග හඳුනා ගැනීම<br>● සීලන්ටෙරාටා<br>● හයිඩ්‍රොසොවා<br>● ස්කිපොසොවා<br>● අන්තොසොවා<br>● ප්ලටිහෙල්මින්තෙස් | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ටර්බෙලාරියා<br>• ට්‍රෙමටෝඩා<br>• සෙස්ටෝඩා<br>• අනෙලීඩා<br>• පොලිකීටා<br>• ඔලිගොකේටා<br>• හිරුඩිනියා<br>• මොලුස්කා<br>• ගැස්ට්‍රොපොඩා<br>• බිවල්වියා<br>• කෙපලොපොඩා<br>• පොලිප්ලැකොපෝරා<br>• ආත්‍රොපෝඩා<br>• ක්රුස්ටාසෙයා<br>• ඉන්සෙක්ටා<br>• කිලොපොඩා<br>• ඩිප්ලොපොඩා<br>• අරක්නිඩා<br>• එකිනොඩෙර්මටා<br>• අස්ටෙරොයිඩෙයා<br>• ඔපියුරොයිඩෙයා<br>• එකිනොයිඩෙයා<br>• හොලොතුරොයිඩෙයා<br>• ක්‍රිනොයිඩෙයා<br>• ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 3.1.8 කෝඩාටා වංශයට අයත් ජීවීන් අධ්‍යයනය සඳහා ආවේණික ලක්ෂණ භාවිත කරයි. | ● කෝඩාටා වංශයේ වර්ගවල ආවේණික ලක්ෂණ<br>● කොන්ඩ්‍රික්තියේස්<br>● ඔස්ටෙයික්තියේස්<br>● ඇම්ෆිබියා<br>● රෙප්ටිලියා<br>● ආවේස්<br>● මමාලියා<br>● ආවේණික ලක්ෂණ භාවිතයෙන් ඉහත වංශවලට අයත් දර්ශීය ජීවීන් හඳුනා ගැනීම | 5 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 4.1.0 ජෛව ලෝකයේ පෝෂණ ක්‍රියාවලිවල විවිධත්වය ගවේෂණය කරයි. | 4.1.1 ජීවීන්ගේ පෝෂණ විධි විමසා බලයි. | ● පෝෂණය හා එහි අවශ්‍යතාව<br>● ස්වයංපෝෂී පෝෂණය<br>  ● ප්‍රකාශ ස්වයංපෝෂී<br>  ● රසායනික ස්වයංපෝෂී<br>● විෂමපෝෂී පෝෂණය<br>  ● විෂමපෝෂී පෝෂණ ක්‍රියාවලිය<br>  ● විෂමපෝෂී පෝෂණ ආකාර<br>    ● මෘතෝපජීවී පෝෂණය<br>    ● සත්ත්ව සදෘශ පෝෂණය<br>    ● සහජීවනය<br>      ● අන්‍යෝන්‍යාධාරය<br>      ● පරපෝෂිතාව<br>      ● සහභෝජිත්වය<br>● කෘමිභක්ෂක ශාක | 6 |
| | 4.1.2 ශාකවල ප්‍රශස්ත වර්ධනය සඳහා ඇති පෝෂණ අවශ්‍යතා විශ්ලේෂණය කරයි. | ● ශාකවලට අවශ්‍ය අධිමාත්‍ර හා අංශුමාත්‍ර මූලද්‍රව්‍ය<br>  ● අවශෝෂණය කර ගන්නා ආකාරය<br>  ● කෘත්‍ය හා ඌනතා ලක්ෂණ | 3 |
| | 4.1.3 මිනිස් ආහාර මාර්ග පද්ධතියේ ව්‍යුහය එහි කෘත්‍යවලට සම්බන්ධ කරයි. | ● මිනිස් ජීරණ පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍ය<br>  ● ආහාර මාර්ගය<br>  ● ආශ්‍රිත ග්‍රන්ථි<br>  ● මිනිසාගේ ආහාර ජීරණයේ ස්නායුමය හා අන්තරාසර්ග යාමනය | 7 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | ● ආහාරවල අඩංගු සංරචක හා කෘත්‍ය<br>● කාබොහයිඩ්‍රේට<br>● ප්‍රෝටීන<br>● ලිපිඩ<br>● විටමින<br>● ඛනිජ මූලද්‍රව්‍ය<br>● ජලය<br>● තන්තු<br>● ප්‍රභව හා ඌනතා ලක්ෂණ<br>● ආහාර ආශ්‍රිත ආහාර මාර්ගයේ අසාමාන්‍යතා<br>● ගැස්ට්‍රයිටිස්<br>● මල බද්ධය<br>● **මිනිස් ආහාර මාර්ගයේ මූලික පටක විද්‍යාත්මක ව්‍යුහය අධ්‍යයනය සහ එහි එක් එක් ප්‍රදේශවල ඇති ප්‍රධාන වෙනස් කම් ඒවායේ කෘත්‍යයට සම්බන්ධ කිරීම** | |

# 5 ඒකකය - ශ්වසනය

කාලච්ඡේද 12

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 5.1.0 සතුන්ගේ වායු හුවමාරු ක්‍රියාවලි අන්වේෂණය කරයි. | 5.1.1 සත්ත්ව රාජධානියේ ශ්වසන ව්‍යුහ විවිධත්වය ගවේෂණය කරයි. | ● ශ්වසන පෘෂ්ඨවල ලාක්ෂණික<br>● විසරණය සහ ශ්වසන පෘෂ්ඨීය පරිමා අනුපාතය<br>● සතුන්ගේ ශ්වසන ව්‍යුහ<br>  ● දේහාවරණය<br>  ● බාහිර ජලක්ලෝම<br>  ● අභ්‍යන්තර ජලක්ලෝම<br>  ● ශ්වාසනාල<br>  ● පත් පෙනහැලි<br>  ● පෙනහැලි | 6 |
| | 5.1.2 මිනිසාගේ ශ්වසන පද්ධතියේ ව්‍යුහ එහි කෘත්‍යවලට දක්වන සම්බන්ධතා අනාවරණය කරයි. | ● මිනිසාගේ ශ්වසන පද්ධතියේ දළ ව්‍යුහය<br>● පෙනහැලි වාතනය කිරීමේ යන්ත්‍රණය<br>● ශ්වසන චක්‍රය හා ශ්වසන වායු පරිමා<br>● රුධිරය හා වාතය අතර වායු හුවමාරුව<br>● රුධිරය හා පටක අතර වායු හුවමාරුව<br>● මිනිසාගේ ශ්වසන යාමනය<br>● ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝගාබාධ<br>  ● දුම් බීම ශ්වසන පද්ධතිය කෙරෙහි ඇති කෙරෙන බලපෑම<br>  ● දූවිලි ශ්වසන පද්ධතිය කෙරෙහි ඇති කෙරෙන බලපෑම<br>  ● සිලිකා හා ඇස්බැස්ටොස් අංශුවලට නිරාවරණය වීමෙන් ඇති වන වෘත්තිමය ආබාධ<br>● ආකෘති සහ රූප සටහන් භාවිතයෙන් මිනිස් ශ්වසන පද්ධතිය අධ්‍යයනය කිරීම හා ව්‍යායාම මගින් ශ්වසන වේගය හා නාඩි වේගයට ඇති බලපෑම නිරීක්ෂණය කිරීම | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 6.1.0 ජීවීන් තුළ සිදු වන ද්‍රව්‍ය පරිවහනය හා සම්බන්ධ ක්‍රියාවලි විමසා බලයි. | 6.1.1 ශාක තුළ ජලය සහ ඛනිජ පරිවහනය සඳහා අදාළ සංකල්ප හා ක්‍රියාවලි පිළිබඳ විමර්ශනය කරයි. | ● පරිවහනයේ අවශ්‍යතාව<br>● ජල විභව සංකල්පය<br>● සෛලයක ජල විභවය<br>● රික්තක සහිත සෛල තුළට ජලය ඇතුළු වීම, ශූනතාව හා විශූනතාව<br>● ශාක මූලෙහි ව්‍යුහය<br>  ● ජලය අවශෝෂණය හා අරීය පරිවහනය<br>● ශාක දේහය තුළ සිදු වන ජල පරිවහනය<br>  ● ඇපොප්ලාස්ට ගමන් මග<br>  ● සිම්ප්ලාස්ට ගමන් මග<br>  ● රික්තක ගමන් මග<br>  ● ඛනිජ හා ජලය ශාකයක් තුළ උඩුකුරු සන්නයනය<br>  ● සංසක්ති - ආසක්ති - ආතති වාදය<br>  ● හබරල පත්‍ර වෘන්තවල ජල විභවය නිර්ණය කිරීම<br>  ● රෝයො (*Rhoeo*) අපිචර්මීය සිවිවල ද්‍රාව්‍ය විභවය නිර්ණය කිරීම | 10 |
| | 6.1.2 ශාකවල වායු හුවමාරුව සිදු වන ආකාරය විමසා බලයි. | ● ප්‍රධාන වායු හුවමාරු පෘෂ්ඨය ලෙස ශාක පත්‍ර<br>  ● ශාක පත්‍රවල ව්‍යුහය<br>  ● පූටිකාවල ව්‍යුහය හා කෘත්‍ය<br>● පූටිකා හා වා සිදුරු මඟින් කෙරෙන වායු හුවමාරුව | 3 |
| | 6.1.3 ශාක තුළින් ජලය ඉවත් වීමේ ක්‍රියාවලිය විමසා බලයි. | ● උත්ස්වේදනය<br>  ● උත්ස්වේදන මාර්ග<br>  ● උත්ස්වේදනය සඳහා බලපාන සාධක | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | ● උත්ස්වේදනය අවම කිරීම සඳහා ශාක දක්වන අනුවර්තන<br>● මූලපීඩනය හා බින්දුදය<br>● ශාක පත්‍ර සහ ප්‍රරෝහවල උත්ස්වේදන ශීඝ්‍රතා නිර්ණය කිරීම | |
| | 6.1.4 ශාක තුළ ආහාර පරිසංක්‍රමණය කෙරෙහි දායක වන ක්‍රියාවලි විමසා බලයි. | ● ෆ්ලෝයමීය පරිසංක්‍රමණය<br>● ෆ්ලෝයම පටකයේ ව්‍යුහය<br>● ෆ්ලෝයම බැර කිරීම<br>● ෆ්ලෝයමය තුළ සිදු වන ස්කන්ධ ප්‍රවාහය<br>● ෆ්ලෝයම හර කිරීම | 4 |
| | 6.1.5 සතුන්ගේ සංසරණ පද්ධතිවල සංවිධානය සහ ක්‍රියාකාරීත්වය විමසා බලයි. | ● සතුන් තුළ දැකිය හැකි ප්‍රධාන සංසරණ පද්ධති<br>● සංවෘත හා විවෘත සංසරණ පද්ධති<br>● ඒක සංසරණය හා ද්විත්ව සංසරණය | 2 |
| | 6.1.6 මිනිසාගේ සංසරණ පද්ධතියේ ව්‍යුහය එහි කෘත්‍යවලට දක්වන සම්බන්ධතා අනාවරණය කරයි. | ● මිනිස් පරිවහන පද්ධතියේ ව්‍යුහය හා කෘත්‍ය<br>● රුධිර වාහිනී පද්ධතිය සහ වසා පද්ධතිය<br>● හෘදයේ ව්‍යුහය හා කෘත්‍යය<br>● හෘත් පේශිය<br>● කන්තුක චක්‍රය/හෘත් චක්‍රය<br>● විද්‍යුත්කන්තුරේඛය (Electrocardiogram)<br>● ආකුංච හා විස්තාර රුධිර පීඩන | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • අත්‍යාතතිය හා මන්දාතතිය<br>• කිරීටක සංසරණය හා කිරීටක ධමනි අවහිර වීමේ ප්‍රතිඵල<br>• ශල්‍ය ප්‍රතිකර්ම<br>  • විපථ සැත්කම්, විවෘත හදවත් සැත්කම් හා හෘද බද්ධ කිරීම් | |
| | 6.1.7 රුධිරයේ කාර්යභාරය විමසා බලයි. | • රුධිරයේ සංයුතිය<br>• මිනිසාගේ ශ්වසන වර්ණක<br>• වෙනත් සතුන්ගේ ශ්වසන වර්ණක<br>• ශ්වසන වායු හා වෙනත් ද්‍රව්‍ය පරිවහනය<br>• රුධිරයේ වෙනත් කෘත්‍ය<br>• රුධිර පරීක්ෂණ තුළින් රෝග හඳුනා ගැනීම<br>  • රුධිර ගිණීම<br>• රුධිර ගණ<br>• රුධිර පාරවිලයනය<br>• නිදර්ශක/ආකෘති/රූප සටහන් භාවිතයෙන් මිනිස් සංසරණ පද්ධතිය අධ්‍යයනය කිරීම | 8 |

# 7 ඒකකය - සමායෝජනය හා සමස්ථිතිය

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 7.1.0 ජීවීන්ගේ සමායෝජනය සහ සමස්ථිතියට අදාළ ව්‍යුහ හා කෘත්‍ය විමර්ශනය කරයි. | 7.1.1 සමායෝජන ක්‍රියාවලිය හා ඊට දායක වන පද්ධති පිළිබඳ විමර්ශනය කරයි. | ● සමායෝජනයේ අවශ්‍යතාව<br>● සමායෝජනය සඳහා දායක වන පද්ධති<br>● ස්නායු පද්ධතිය<br>● අන්තරාසර්ග පද්ධතිය<br>● සමායෝජනය සඳහා රුධිර සංසරණ පද්ධතියේ දායකත්වය<br>● ස්නායු පද්ධතියේ හා අන්තරාසර්ග පද්ධතියේ සමානතා හා අසමානතා (සමායෝජනයට අදාළ ව) | 2 |
| | 7.1.2 සතුන්ගේ ස්නායුක සංවිධාන සැලැස්ම පිළිබඳ විස්තාරණය කරයි. | ● සතුන්ගේ ස්නායුක සංවිධාන වර්ග<br>● ඒක සෛලික<br>● බහු සෛලික<br>● නිඩාරියා-ස්නායු ජාලය<br>● ප්ලටිහෙල්මින්තෙස්-මස්තිෂ්ක ගැංග්ලියා හා අන්වායාම ස්නායු<br>● අනෙලිඩා-මස්තිෂ්ක ගැංග්ලියා, උදරීය ගැංග්ලියා හා ද්විත්ව උදරීය ස්නායු රජ්ජු<br>● ආත්‍රොපොඩා - මස්තිෂ්ක ගැංග්ලියා<br>● මොලුස්කා - ස්නායු පද්ධතිය<br>● එකිනොඩෙර්මටා-අරීය ස්නායු රජ්ජු හා ස්නායු ජාලය<br>● කෝඩාටා-මොළය හා පෘෂ්ඨීය ස්නායු රජ්ජුව<br>● ආකෘති හා රූප සටහන් භාවිතයෙන් සතුන්ගේ ස්නායු පද්ධතිවල රටා අධ්‍යයනය කිරීම | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.1.3 මිනිස් ස්නායු පද්ධතියේ දළ ව්‍යුහය හා කෘත්‍ය විමසා බලයි. | ● මිනිස් ස්නායු පද්ධතියේ සංවිධානය හා ප්‍රධාන අංග<br>  ● මධ්‍ය ස්නායු පද්ධතිය<br>    ● මොළය<br>    ● සුෂුම්නාව<br>  ● පර්යන්ත ස්නායු පද්ධතිය<br>    ● කපාල ස්නායු<br>    ● සුෂුම්නා ස්නායු<br>  ● ස්වයං සාධක ස්නායු පද්ධතිය<br>    ● අනුවේගී පද්ධතිය, ප්‍රත්‍යනුවේගී පද්ධතිය සහ ඒවායේ කෘත්‍ය<br>    ● සමස්ත කෘත්‍යය | 8 |
| | 7.1.4 ස්නායු ආවේග ජනනය වීම හා සම්ප්‍රේෂණය සිදු වන ආකාරය ගවේෂණය කරයි. | ● මිනිස් ස්නායු පද්ධතියේ සංවිධානය<br>  ● නියුරෝනවල ව්‍යුහය<br>    ● සෛල දේහය<br>    ● අනුශාඛිකා<br>    ● අක්සන<br>  ● ආශ්‍රිත සෛල<br>    ● නියුරොග්ලියා<br>    ● ශ්වාන් සෛල<br>● නියුරෝනවල කායික විද්‍යාව<br>  ● අක්‍රිය විභවය<br>  ● ක්‍රියා විභවය<br>  ● ස්නායු ආවේග සම්ප්‍රේෂණය (මයලින් සහිත හා මයලින් රහිත ස්නායුවල) | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | ● උපාගමය<br>● නියුරෝනය - නියුරෝනය<br>● නියුරෝනය - කංකාල පේශි<br>● ස්නායු ආවේග සම්ප්‍රේෂකවල කාර්ය භාරය (ඇසිටිල් කෝලින්, ඇඩ්රිනලින් හා නොරැඩ්රිනලින්)<br>● ප්‍රතීක චාපය<br>● අභිවාහි - සංවේදී ස්නායු<br>● අපවාහි - චාලක ස්නායු<br>● අන්තර්භාර නියුරෝන | |
| | 7.1.5 මිනිස් මොළයේ ව්‍යුහය හා කෘත්‍ය ගවේෂණය කරයි. | ● මිනිස් මොළයේ ප්‍රධාන කොටස් (සංරචක) හා කෘත්‍ය<br>● මෙනින්ජි පටල<br>● මස්තිෂ්ක කෝෂිකා හා මස්තිෂ්ක - සුෂුම්නා තරලය<br>● මස්තිෂ්ක වෘන්තය<br>● වැරෝලි සේතුව<br>● සුෂුම්නා ශීර්ෂකය<br>● මැද මොළය<br>● අනුමස්තිෂ්කය<br>● මස්තිෂ්කය<br>● පාර්ශ්වික ඛණ්ඩිකා<br>● මස්තිෂ්ක බාහිකය<br>● සංවේදක පෙදෙස<br>● සංගාමී පෙදෙස<br>● චාලක පෙදෙස<br>● තැලමස<br>● හයිපොතැලමස | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.1.6 ජීවීන්ගේ විවිධ සංවේදී ව්‍යුහවල ක්‍රියාකාරිත්වය ගවේෂණය කරයි. | • මිනිසාගේ සංවේදී ව්‍යුහ (ප්‍රතිග්‍රාහක)<br>  • මූලික ලක්ෂණ<br>  • වර්ග<br>    • රසායන ප්‍රතිග්‍රාහක<br>      • රස ප්‍රතිග්‍රාහක<br>      • ගන්ධ ප්‍රතිග්‍රාහක<br>    • තාප ප්‍රතිග්‍රාහක<br>      • සීතල - ක්‍රවුස් අන්ත බල්බ<br>      • උණුසුම - රෆිනි දේහාණු<br>      • නිදහස් ස්නායු අන්ත<br>    • ආලෝක ප්‍රතිග්‍රාහක<br>      • යෂ්ටි<br>      • කේතු<br>    • ස්කන්ධ ප්‍රතිග්‍රාහක<br>      • ස්පර්ශ ප්‍රතිග්‍රාහක - මයිස්නර් දේහාණු , මර්කල් මඬල<br>      • පීඩන ප්‍රතිග්‍රාහක - පැසිනි දේහාණු<br>    • කම්පන ප්‍රතිග්‍රාහක<br>      • ස්පර්ශ ප්‍රතිග්‍රාහකවලින් වැඩි කොටස<br>    • වේදනා ප්‍රතිග්‍රාහක<br>      • විශේෂිත ස්නායු අන්ත<br>• සතුන් තුළ දැකිය හැකි ප්‍රතිග්‍රාහක වර්ග<br>  • අක්ෂි ලප<br>  • සරල ඇස්<br>  • සංයුක්ත ඇස්<br>• රූප සටහන් හා ආකෘති භාවිතයෙන් සතුන්ගේ සංවේදී ව්‍යුහ අධ්‍යයනය කිරීම | 7 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.1.7 මිනිස් ඇසෙහි සහ කනෙහි ව්‍යුහ ඒවායේ කෘත්‍යවලට දක්වන සම්බන්ධතා අනාවරණය කරයි. | ● මිනිස් ඇසෙහි මූලික ව්‍යුහය හා කෘත්‍යය<br>● මිනිස් කනෙහි මූලික ව්‍යුහය හා කෘත්‍යය<br>● රූප සටහන් හා ආකෘති භාවිතයෙන් මිනිස් ඇසේ හා කනෙහි ව්‍යුහ අධ්‍යයනය කිරීම | 6 |
| | 7.1.8 මිනිස් අන්තරාසර්ග පද්ධතියේ කාර්යභාරය විශ්ලේෂණය කරයි. | ● මිනිස් අන්තරාසර්ග පද්ධතිය<br>  ● අන්තරාසර්ග ග්‍රන්ථිවල පිහිටීම හා ඒවායේ කෘත්‍ය<br>    ● හයිපොතැලමස<br>    ● පිටියුටරි ග්‍රන්ථිය<br>    ● තයිරොයිඩ් ග්‍රන්ථිය<br>    ● පැරාතයිරොයිඩ් ග්‍රන්ථිය<br>    ● තයිමස් ග්‍රන්ථිය<br>    ● අධිවෘක්ක ග්‍රන්ථි<br>    ● ලැන්ගර්හැන් දීපිකා<br>    ● ප්‍රජනනේන්ද්‍රිය<br>● ප්‍රතිපෝෂී යන්ත්‍රණ (අන්තරාසර්ග පද්ධතියට අදාළ ව)<br>  ● සෘණ<br>  ● ධන | 8 |
| | 7.1.9 දේහ අභ්‍යන්තර පරිසරය නියත ව පවත්වා ගන්නා ආකාරය විමසා බලයි. | ● සමස්ථිතිය<br>  ● අභ්‍යන්තර හා බාහිර පරිසරය<br>● මිනිසාගේ සමස්ථිතික ක්‍රියාවලිය<br>  ● උෂ්ණත්ව යාමනය<br>  ● රුධිර ගත ග්ලූකෝස් යාමනය<br>  ● ආස්‍රැති විධානය<br>● සමස්ථිතිය සම්බන්ධ අක්මාවේ කාර්යභාරය | 6 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.1.10 මිනිස් සමේ මූලික ව්‍යුහය හා කෘත්‍ය අන්වේෂණය කරයි. | ● මිනිස් සමේ මූලික ස්තර<br>● රෝම<br>● ග්‍රන්ථි<br>● ප්‍රතිග්‍රාහක<br>● සමෙහි කෘත්‍ය | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 8.10 නීරෝගී දිවි පැවැත්මක් උදෙසා බහිස්‍රාවී පද්ධතියේ දායකත්වය විශ්ලේෂණය කරයි. | 8.1.1 ජීවීන්ගේ පරිවෘත්තිය හා බහිස්‍රාවී ද්‍රව්‍ය අතර සම්බන්ධතා ගොඩ නගයි. | ● බහිස්‍රාවීය ද්‍රව්‍ය හා පරිවෘත්තීය අතර සම්බන්ධතාව<br>● කාබෝහයිඩ්‍රේට<br>● මේද<br>● ප්‍රෝටීන<br>● නියුක්ලෙයික් අම්ල<br>● නයිට්‍රජනීය බහිස්‍රාවයේ අන්තඵල<br>● $NH_3$<br>● යූරියා<br>● යූරික් අම්ලය<br>● ක්‍රියටිනයින්<br>● ඉහත අන්තඵල බහිස්‍රාවය කිරීමේ වාසි හා අවාසි<br>● අන්තඵල සහ ජීවත් වන පරිසරය අතර සම්බන්ධතාව<br>● බහිස්‍රාවයේ වෙනත් අන්තඵල<br>● $CO_2$<br>● පිත් වර්ණක | 4 |
| | 8.1.2 ජීවීන්ගේ බහිස්‍රාවී ව්‍යුහවල විවිධත්වය විමසා බලයි. | ● සතුන් අතර දක්නට ලැබෙන විවිධ බහිස්‍රාවීය ව්‍යුහ<br>● දේහාවරණය<br>● සංකෝචක රික්තක<br>● සිළු සෛල (ප්‍රාග්වෘක්කිකා)<br>● වෘක්කිකා<br>● මැල්පිගීය නාලිකා<br>● හරිත ග්‍රන්ථි<br>● ස්වේද ග්‍රන්ථි<br>● ලවණ ග්‍රන්ථි<br>● රූප සටහන් භාවිතයෙන් සතුන්ගේ බහිස්‍රාවී ව්‍යුහ අධ්‍යයනය කිරීම | 7 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 8.1.3 මිනිස් බහිස්ස්‍රාවීය පද්ධතියේ දළ ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනය කරයි. | • මිනිසාගේ මූත්‍ර පද්ධතිය<br>  • මිනිසාගේ මූත්‍ර පද්ධතියේ කොටස්<br>    • වෘක්කය<br>      • පිහිටීම<br>      • රුධිර සැපයුම<br>      • ව්‍යුහය<br>    • මූත්‍ර වාහිනි<br>    • මූත්‍රාශය<br>    • මූත්‍ර මාර්ගය<br>    • ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය ලෙස වෘක්කාණුව<br>      • මූත්‍ර සෑදීමේ ක්‍රියාවලිය<br>        • අතිපරිශ්‍රාවණය<br>        • වරණීය ප්‍රතිශෝෂණය<br>        • ශ්‍රාවය<br>• වෘක්ක ක්‍රියාකාරීත්වය කෙරෙහි හෝර්මෝනවල බලපෑම<br>  • ADH<br>  • ඇල්ඩොස්ටෙරෝන්<br>• වෘක්කයේ වෙනත් කෘත්‍ය(වෘක්කය ප්‍රධාන සමස්ථිතික අවයවයක් ලෙස)<br>  • ආස්‍රැති විධානය<br>  • රුධිර පරිමාව පාලනය<br>  • රුධිර pH යාමනය<br>  • හෝර්මෝන ශ්‍රාවය<br>    • එරිත්‍රොපොයිටින්<br>    • රිනින් | 9 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • රුධිර පරිමාව හා රුධිර පීඩන යාමනය<br>• මිනිස් බහිස්ස්‍රාවී පද්ධතිය ආශ්‍රිත සුලබ ආබාධ<br>• වෘක්ක අශ්මය (ගල්) හා මූත්‍රාශ ගල්<br>• ආබාධ වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග<br>• රෝග හඳුනා ගැනීමේ දී මූත්‍රවල කාර්යභාරය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 9.1.0 ජීවීන්ගේ සන්ධාරණය සඳහා සැකැසී ඇති පද්ධති හා චලන ක්‍රම විමසා බලයි. | 9.1.1 සතුන්ගේ සැකිලි පද්ධතිවල ව්‍යුහය හා කෘත්‍ය විමසා බලයි. | ● සතුන්ගේ දක්නට ලැබෙන ප්‍රධාන සැකිලි වර්ග හා ඒවායේ සංවිධානය<br>● ද්‍රවස්ථිති සැකිල්ල<br>● සීලෝමය-අනෙලිඩාවන්<br>● පිට සැකිල්ල<br>● කයිටිනීය පිට සැකිල්ල - ආත්‍රොපොඩා<br>● කැල්සියම් කාබනේට් පිටසැකිල්ල- මොලුස්කා<br>● අස්ථි තල-උරග (ඉබ්බා)<br>● අභ්‍යන්තර සැකිල්ල<br>● කැල්සියම් කාබනේට් තල- එකිනොඩේර්මටා<br>● අස්ථි - කෝඩාටා<br>● කාටිලේජ - කෝඩාටා<br>● මිනිසාගේ අස්ථි හා කාටිලේජවල අණ්වීක්ෂීය ව්‍යුහය<br>● අස්ථි පද්ධතියේ කෘත්‍ය<br>● සන්ධාරණය<br>● ආරක්ෂාව<br>● චලනය<br>● කැල්සියම් ගබඩා කිරීම හා නිදහස් කිරීම<br>● පොස්පේට් ගබඩා කිරීම හා නිදහස් කිරීම<br>● රුධිර සෛල නිපදවීම | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.1.2 මිනිසාගේ ආක්ෂක ඇටසැකිල්ලේ ව්‍යුහය හා කෘත්‍ය අන්වේෂණය කරයි. | ● මිනිස් කංකාල පද්ධතියේ සංවිධානය<br>● ආක්ෂක ඇටසැකිල්ල<br>● හිස් කබල<br>● ප්‍රධාන අස්ථි<br>● උඩු හනුව හා යටි හනුව<br>● කෝටරක<br>● ප්‍රධාන ප්‍රසර<br>● කශේරුව<br>● වක්‍ර සතර හා ප්‍රධාන ප්‍රදේශ<br>● කශේරුකා වර්ග<br>● අන්තර්කශේරුක මඬල<br>● පර්ශු<br>● උරතලය<br>● ආකෘති හා රූප සටහන් භාවිතයෙන් මිනිස් හිස්කබල හා කශේරුවේ දළ ව්‍යුහයත්, එය එහි කෘත්‍යවලට දක්වන සම්බන්ධතාවත්, අධ්‍යයනය කිරීම | 8 |
| | 9.1.3 මිනිසාගේ ගාත්‍ර ඇටසැකිල්ලේ ව්‍යුහය හා කෘත්‍ය අන්වේෂණය කරයි. | ● ගාත්‍ර ඇටසැකිල්ල<br>● උර මේඛලාවේ කෘත්‍යවලට අදාළ ව එහි සාමාන්‍ය ව්‍යුහය<br>● ශ්‍රෝණි මේඛලාවේ කෘත්‍යවලට අදාළ ව එහි සාමාන්‍ය ව්‍යුහය<br>● ස්ත්‍රී හා පුරුෂ ශ්‍රෝණි<br>● සුනම්‍යතාවට අදාළ ව පූර්ව ගාත්‍රවල සාමාන්‍ය ව්‍යුහය | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | ● ශක්තිමත්භාවය, සෘජු කාය විලාසය, දේහ බර දරා සිටීම හා ඇවිදීමට අදාළ ව අපර ගාත්‍රයේ සාමාන්‍ය ව්‍යුහය<br>● පත්ලේ වක්‍ර<br>● ආබාධ සහ අසාමාන්‍යතා<br>● අස්ථිපර්වදාහය (Osteoartheritis)<br>● අස්ථිවෛවර්යය (Osteoporosis)<br>● නිදර්ශක, ආකෘති හා රූපසටහන් භාවිතයෙන් මිනිසාගේ උර මේඛලාව, ශ්‍රෝණි මේඛලාව හා ගාත්‍ර ඇටසැකිල්ල අධ්‍යයනය කිරීම | |
| | 9.1.4 සතුන්ගේ සංචරණ ව්‍යුහ ගවේෂණය කරයි. | ● චලනය<br>● සංචරණ ආකාර<br>● ව්‍යාජ පාද මඟින්<br>● කෂිකා මඟින්<br>● පක්ෂ්ම මඟින්<br>● පේශි මඟින් | 2 |
| | 9.1.5 විවිධ පේශි පටකවල මූලික ව්‍යුහය හා කායික විද්‍යාව අන්වේෂණය කරයි. | ● පේශි පටකය<br>● මූලික ලක්ෂණ<br>● සංකෝචනතාව (Contractility)<br>● උද්දීප්‍යතාව (Excitability)<br>● විතන්‍යතාව ( Extensibility )<br>● ප්‍රත්‍යස්ථතාව (Elasticity )<br>● පේශි වර්ග සහ පේශි තන්තුවල මූලික ව්‍යුහය හා කායකර්මය | 8 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | ● සිනිඳු පේශි<br>● හෘත් පේශි<br>● කංකාල පේශි<br>● සාකොමියරයේ ව්‍යුහය හා කංකාල පේශි චලනයේ මූලික යන්ත්‍රණය<br>● සර්පණ සූත්‍රිකා වාදයේ මූලික සංකල්ප (Sliding filament theory ) | |
| | 9.1.6 ශාකවල සන්ධාරණය හා චලන ආකාර පිළිබඳ විමර්ශනය කරයි. | ● ශාකවල සන්ධාරණය<br>● ශූනතාව<br>● ප්‍රාථමික හා ද්විතියික ශාක දේහවල සන්ධාරණ ශක්තිය ලබා දෙන පටක<br>● ශාක චලන<br>● ආවර්තී චලන<br>● ප්‍රභාවර්තී, ගුරුත්වාවර්තී සහ ස්පර්ශාවර්තී චලන<br>● ආවර්තී චලනවල දී ඔක්සින්වලින් කෙරෙන කාර්ය<br>● සාර්වසර චලන<br>● සන්නමන චලන<br>● ස්පර්ශ සන්නමන<br>● නිද්‍රා සන්නමන<br>● තෝරා ගත් පත්‍රයක, කඳක හා මුලක හරස්කඩ ඡේද අණ්වීක්ෂයෙන් නිරීක්ෂණය කිරීම | 8 |

# 3.0 විෂය නිර්දේශය

## 3.2 - 13 වන ශ්‍රේණිය

10 ඒකකය - ප්‍රජනනය, වර්ධනය සහ විකසනය

කාලච්ඡේද 78

| නිපුණතාව | නිපුණතා මට්ටම් | සන්ධාරය | කාලච්ඡේද |
|---|---|---|---|
| 10.1.0 ජීවීන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය විමසා බලයි. | 10.1.1 ජීවීන්ගේ ප්‍රජනන රටා විමසා බලයි. | ● ජීවීන් තුළ දක්නට ලැබෙන විවිධ ප්‍රජනන ක්‍රම<br>● අලිංගික හා ලිංගික ප්‍රජනනය<br>● අලිංගික ප්‍රජනනය<br>● විඛණ්ඩනය<br>● ද්විඛණ්ඩනය<br>● බහුඛණ්ඩනය<br>● අංකුර වැඩීම-අංකුරණය<br>● කඩ කඩ වීම<br>● බීජාණු සෑදීම<br>● ලිංගික ප්‍රජනනය<br>● ද්විලිංගිකතාව හා ඒකලිංගිකතාව<br>● කෞමාරෝද්භවය<br>● ජන්මාණු සෑදීම<br>● සංසේචනය<br>● බාහිර හා අභ්‍යන්තර<br>● ප්‍රජනනයේ දී ඌනනයේ කාර්යභාරය<br>● ජීවන චක්‍රවල ඒකගුණ හා ද්විගුණ අවස්ථා<br>● ප්‍රවේණි ප්‍රභේදනය (විවිධත්වය) | 8 |
